බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව - 2024

----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ අංක 3.32 ඡේදයට අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අතිරික්තය ගැලපුම් කිරීමේදී රු.25,103,623 ක් වූ වර්ෂයට අදාල ආයෝජන ආදායම අඩු කර නොතිබුණු අතර තොගවල ශුද්ධ වැඩිවීම රු. 524,579 ක් වුවත් එය රු. 392,079 ක් ලෙස දක්වා තිබුණි.	ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය මුදල් ප්‍රවාහයට ගෙන නොමැති අතර 2023 දෙසැම්බර් 31 දිනට තොගයේ වූ වෙනසක් නිවැරදි කිරීමක් සිදු කර ඇති බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ අංක 3.30 ඡේදයට අනුව මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ අස්ථිත්වයට දායක වූ ප්‍රාග්ධන ලැබීම් රු. 13,288,864 ක මුදල මුදල් ගලා ඒමක් ලෙස පෙන්විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	-එම-.
(ඇ)	ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ අංක 6.13 ඡේදයට අනුව වත්කමක් භාවිතය සඳහා ලබාගත හැකි අවස්ථාවේ සිට එය ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී භාවිතය ආරම්භ කරන ලද රු.16,518,660 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය කර නොතිබුණි.	පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 27 දිනැති අංක එල්ජීඩී/09/2019 අනුව කටයුතු කර ඇති බව.	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබුණු විදුලි ගබඩා තොග ශේෂය නිවැරදි කිරීමක් ලෙස රු. 132,500 ක මුදලක් සාවද්‍ය ලෙස විදුලි ගබඩා තොග ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි.	2023 වර්ෂයේ විදුලි භාණ්ඩ අවසන් ශේෂයෙහි වූ වරද නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් 06 මගින් මෙම ගැලපීම සිදු කර ඇති බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.35,649,214 ක් විය යුතු වුවත්, මුදලින් ලද රු.13,288,864 ක මුදල පමණක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දැක්වීම නිසා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.22,360,350 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරිමේදී නිවැරදි කරන බව.	-එම-.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයට විස්තීර්ණ ආදායම රු.242,993,869 ක් විය යුතු වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ රු.220,633,518 ක් වශයෙන්දක්වා තිබුණි.	-එම-.	-එම-.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ප්‍රදාන රු.106,993,516 ක් විය යුතු වුවත් එය රු.71,344,302 ක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා තිබුණි.	ප්‍රාග්ධන වියදම් දීමනා ලෙස ඇතුලත් වන්නේ හඳුනා නොගත් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය බව.	-එම-.

1.7 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 අංක 56 හා 2000 අංක 53 දරන සංශෝධිත පනත මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත	පරිසර ආරක්ෂක බලපත්‍රයක් නොමැතිව පරිසරයට අපද්‍රව්‍ය හෝ ශබ්දය මුදා හැරීම, තැන්පත් කිරීම හා විමෝචනය කිරීම කළ නොහැකි අතර එවැනි ආයතන සොයාබලා ඒ සඳහා පාරිසරික බලපත්‍ර ලබාදීමට කටයුතු කළ යුතු වුවත් බල ප්‍රදේශයේ පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතන 06 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි.	බලපත්‍ර ලබා නොගත් ආයතනවලට බලපත්‍ර ලබා ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව.	පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතනවලට පරිසර බලපත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය.
(ආ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත			
	(i) 134(1) වගන්තිය	කාලානුරූපීව සභා බල ප්‍රදේශයේ නව සංවර්ධන ප්‍රදේශ හඳුනාගෙන නියමිත පරිදි ගැසට් කර වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.	පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත අනුමැතිය සඳහා ලිපි යොමු කර ඇති බව.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	(ii) 158 (අ) වගන්තිය	හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි.	වරිපනම් නොගෙවූ දේපලවලින් වත්කම් කිහිපයක් රැගෙන ඒමට කටයුතු කළ බව.	-එම-.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i) මු.රෙ. 104	2023 වර්ෂයේදී නගර ශාලාවේ පැවති ප්ලාස්ටික් පුටු 39 ක ඌනතාවය සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) මු.රෙ. 1645	වාහන ලොග් පොත් භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරන මාසයට පසු මාසයේ 15 දිනට ප්‍රථම 268 (අ) පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 40 කට අදාලව එසේ කර නොතිබුණි.	ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	-එම-.
(ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සභාව සතු වාහන 36 ක ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි.	ට්‍රැක්ටර් රථවල ඉන්ධන දහන පරීක්ෂා නිතර නිතර කිරීමේදී ධාවන පැය අගයන් වෙනස්වීම ආයතනයට අවාසිදායක තත්ත්වයක් වන බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ) 2016 පෙබරවාරි 29 දිනැති 01/2016 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය	සභාව සතු වාහන ආයතනයේ නමට පවරාගත යුතු වුවත් එක් කැබ් රථයක් සභාව වෙත පවරාගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු කරන ලෙස තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික) වෙත දන්වා ඇති බව.	-එම-.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.207,344,654 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 78,802,975 ක් විය.

2.2 මූල්‍ය පාලනය

මහජන බැංකු ගමේ කඩේ ගිණුම 2024 ජනවාරි මාසයේ සිට විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම් කිරීම සඳහා පමණක් භාවිතා කර ඌණ අක්‍රීය තත්ත්වයේ තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේඛම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	13,032,675	13,913,659	13,084,309	1,693,872	6,874,691	7,612,091	6,960,442	1,947,516
(ii)	කුලී	6,012,100	6,529,485	5,870,650	779,987	5,449,210	5,850,913	5,140,183	1,494,322
(iii)	බලපත්‍ර ගාස්තු	365,000	585,000	585,000	-	183,000	444,000	444,000	-
(iv)	වෙනත් ආදායම්	335,000	387,300	387,300	-	264,110	324,915	324,915	-
		------------	-------------	------------	-------------	------------	------------	------------	-------------
		19,744,775	21,415,444	19,927,259	2,473,859	12,771,011	14,231,919	12,869,540	3,441,838
		========	========	========	=========	=======	=======	=======	========

2.3.2 **ආදායම් රැස්කිරීමේ** කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ) වරිපනම් හා බදු		
(i) 2024 ජනවාරි 01 දිනට වරිපනම් හිඟය රු. 1,944,516 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.864,522 ක් හෙවත් සියයට 44 ක් අයකර නොතිබුණි.	හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ii) පසුගිය වර්ෂවල හිඟ වරිපනම් ආදායමින් රු. 101,674 ක් වර්ෂ 10 කට වඩා වැඩි හිඟ වරිපනම් හිඟ ශේෂයක් වූ අතර රු.129,543 ක් වර්ෂ 05 ත්10 ත් අතර විය.	හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ) කුලී		
(i) නව සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 22 දරන කඩ කාමරය වෙනුවෙන් අයකර ගත යුතු කඩ කුලිය නියමිත පරිදි අයකර නොගැනීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට එම කඩ කාමරයෙන් ලැබිය යුතු කුලිය රු.76,494 ක් විය. නියමිත පරිදි කඩ කුලිය නොගෙවීම සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	-එම-.	නඩුව අවසන් වූ වහාම ගිවිසුම යාවත්කාලීන කර කුලී අයකළ යුතුය.
(ii) සමාලෝචිත වර්ෂයේ වෙළඳ ස්ථාන කුලී ආදායම බිල් කිරීම රු. 5,089,385 ක්ද, බදුකර කුලී බිල් කිරීම රු. 1,440,100 ක්ද වූ අතර ඉන් වර්ෂය තුළ පිළිවෙලින් රු. 4,975,050 ක් හා රු. 895,600 ක ආදායමක් එකතු කරගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට හිඟ වෙළඳ ස්ථාන කුලී වටිනාකම රු. 114,335 ක් වූ අතර බදුකර කුලී ආදායම රු. 544,500 ක හිඟයක් විය.	2025 මාර්තු 31 දිනට වෙළඳ ස්ථාන කුලී හිඟ ශේෂය රු.52,000 ක් ද, බදුකර කුලී හිඟ ශේෂය රු.544,500 ක් වේ. බදුකර කුලී හිඟ පවතින්නේ අංක 07 කඩකාමරයට පමණක් වන අතර, ඊට අදාල නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාත්මක වී ඇති බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,302,132 ක් වූ අතර මුද්දර ගාස්තු සඳහා 2024 වර්ෂයේදී බිල් කිරීමක් සිදුකිරීමකින් තොරව 2021, 2022 සහ 2023 යන වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලියන ලද උපලේඛන මත පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවන ලද මුද්දර ගාස්තු රු. 224,676,144 ක් ද සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු රු. 717,970 ක මුදල ද සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.	2021 වර්ෂයේ පානදුර උසාවි දඩ මුදල වන රු.2,302,132ක් අතරින් රු.1,665,119 ක් 2025.01.16 දින ලැබි ඇති අතර , රු.637,013 ක් උපලේඛනවල අඩුපාඩු බැවින් නැවත උපලේඛන සකස් කර 2025.03.19 දින පළාත් ආදායම් කොමසාරිස් වෙත යවන ලද බව.	හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කර්මාන්ත ණයගිම් උපලේඛනය හා කර්මාන්ත ලේඛනය අතර නිරීක්ෂණය වී තිබූ රු.76,887ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනසට හේතුව හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් ලබා ගෙන තිබුණු රු. 1,351,881ක තැන්පතුවලට අදාල කාර්යයන් සමාලෝචිත වර්ෂයේ නිම කර තිබුණේදැයි පරික්ෂා කිරීමකින් තොරව වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	කර්මාන්ත ණයගිම් ශේෂය තුල වූ 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව එකතුව රු.66,160,912 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ශේෂ තහවුරු කිරීමක් කර නිරවුල් නොවූ ණය ශේෂ නිරවුල් කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 6,614,079 ක් වූ පෙර ගෙවුම් ශේෂයෙන් රු.4,485,059 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර 2018 වර්ෂයේ සිට පවතින මෙම අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2020 ට පෙර පැවති හඳුනා ගැනීමට නොහැකි ශේෂයක් පවතින අතර හඳුනා ගැනීමට උත්සාහ කළද උපයෝගී ලේඛන සොයා ගැනීමට නොහැකි වූ බව.	නිරවුල් නොවූ පෙර ගෙවුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	පානදුර දිසා අධිකරණයේ විභාග වූ අංක 2244 දරන නඩුවට අනුව 2014 නොවැම්බර් 05 දින සමථයකට පත්වී ඇති බවත්, සභාව වෙත පවරා දීමට එකඟ වූ බිම් ප්‍රමාණය පවරා ගැනීමට ක්‍රියා කරන ලෙසත් 2024	වත්කම පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	නඩු තීන්දුව අනුව කටයුතු කළ යුතුය.

	නොවැම්බර් 05 දිනැති ලිපිය මගින් නඩුවට පෙනී සිටි නීතිඥවරයා සභාවට දන්වා සිටියද එම භූමිය මේ දක්වා පවරා ගැනීමට සභාව කටයුතු කර නොමැති අතර, ඒ සඳහා නීතිඥ ගාස්තු වශයෙන් සභාව රු. 69,800 ක් ගෙවා තිබුණි.		
(ඊ)	පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 92776 දරන නඩුවට පෙනී සිටීම වෙනුවෙන් අවස්ථා 05 කදී අයවිය යුතු ලෙස දක්වා තිබූ රු. 25,000 ක මුදලක් නීතිඥයෙකු ලෙස පිළිගත හැකි නිල මුද්‍රාවක් නොමැති ලිපියක් වෙනුවෙන් 2014 වර්ෂයේදී සභාව විසින් ගෙවා තිබීමෙන් සභාවට රු. 25,000 ක මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි. මෙම නඩුවට අදාළ කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි.	මෙම නඩුව සම්බන්ධව කිසිදු තොරතුරක් සභාව සතුව නොමැති බවත් 2024 දෙසැම්බර් 09 දින අධිකරණයෙන් අවසන් කාර්යය සටහනක් හා 2024 දෙසැම්බර් 16 දින පැමිණිල්ලේ පිටපතක් ලබා ගන්නා ලද බව.	නඩුව සම්බන්ධ තොරතුරු සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පිරිවැය රු.940,140 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගෙන 2023 ජනවාරි 01 දින දී ආරම්භ කරන ලද ගමේ කඩේ අලෙවි සැල ක්‍රමවත් වැඩ පිළිවෙලක් යටතේ පවත්වාගෙන නොයෑම නිසා දිගින් දිගටම අලාභ ලබමින් තිබුණි	නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින බව.	අලෙවි සැල ක්‍රමවත් වැඩ පිළිවෙලක් යටතේ පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු ගල් රෝල් දෙකක් 2017 වර්ෂයේ සිට ද, තවත් ගල් රෝලක් 2020 වර්ෂයේ සිට ද, බැකෝ ලෝඩරයක් 2021 වර්ෂයේ සිට ද අක්‍රියව පැවති අතර 2024 දෙසැම්බර් 31 වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.	අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතින බව.	අලුත්වැඩියා කටයුතු සිදු කර වත්කම් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය.
(ආ)	සභාව සතු අත් ට්‍රැක්ටර් 02 ක් සහ මෝටර් බයිසිකලයක් අපහරණය සඳහා හඳුනාගෙන 2023 මැයි 23 දින අපහරණ කමිටුවක් ද පත් කර තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කටයුතු සිදු කර නොතිබුණි.	අත් ට්‍රැක්ටර් 02 අළුත්වැඩියා කටයුතු සිදු කිරීමටත් යතුරු පැදිය අපහරණය කිරීමටත් කටයුතු සිදු කර ඇති බව.	අලුත්වැඩියා කටයුතු හා අපහරණ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.
(ඇ)	2024 වර්ෂය අවසානය වන විට තොග ගිණුමේ ඇතුළත් 2024 වර්ෂයට පෙර වර්ෂවලදී මිලදී ගත් රු.198,970ක් වටිනා ටෝනර් 28ක් 2025 මාර්තු 10 දින වන විටත් භාවිතයට නොගෙන ගබඩාවේ පැවතුණි. ඒ අනුව එම ටෝනර් මාස 12 කට වඩා වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.	ඡායා පිටපත් යන්ත්‍රය අක්‍රිය තත්ත්වයේ පවතින බැවින් භාවිතයට ගැනීමට නොහැකිව ඇති බව.	මිලදී ගැනීම් වලදී අවශ්‍යතාවය හඳුනාගෙන සිදු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කොටස් කර වෙන්දේසි කරන ලද ඉඩම්වල වෙන් කරන ලද මාර්ග ප්‍රමාණය ගණනය කර මාර්ග ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මාර්ග ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මාර්ග ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව.	සියළුම මාර්ග ඇතුළත් කර මාර්ග ලේඛනය කඩිනමින් යාවත්කාලීන කළ යුතුය.
(ආ)	2022 වර්ෂයේ මෛත්‍රී නගර ශාලාව සඳහා මිලදීගන්නා ලද එකතුව රු.6,927,260 ක් වූ කුෂන් පුටු හා ශ්‍රවණාගාර පුටු ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනයේ නිවැරදිව සටහන් කිරීමට කටයුතු කර ඇති බව.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ඇ)	කාය වර්ධන මධ්‍යස්ථානයේ පැවති ස්ථාවර වත්කම් 66 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීම වෙනුවට තොග පොත්වල පිරිවැයක් රහිතව සටහන් කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය.
(ඈ)	1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිදු සුසාන භූමියක වැට මායිම් සකස් කර නොතිබුණි.	අයිතිය පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් බණ්ඩාරගම වෙත යොමුකර ඇති අතර සුසාන භූමි පවරා දීමෙන් අනතුරුව වැට මායිම් සකස් කිරීමට අපේක්ෂිත බව.	අයිතිය පවරා ගෙන ඉඩම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ඉ)	බණ්ඩාරගම ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසාන භූමි 25 න් 16 ක හිමිකම සභාව වෙත පවරාගෙන නොතිබුණි.	සුසාන භූමිවල හිමිකාරත්වය පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇති අතර මැනුම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව පවරා ගැනීමට කටයුතු කරන බව.	අයිතිය පවරා ගෙන ඉඩම්වල ආරක්ෂාව තහවුරු කර ගත යුතුය.
(ඊ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් පැවරීමට එකඟ වී ඇති සුසාන භූමි 08 අතරින් වල්ගම හා පමුණුගම පොදු සුසාන භූමි 02 හි මැනුම් කටයුතු අවසන් කර මැනුම් ගාස්තුද සභාව විසින් ගෙවා තිබුණද පිඹුරු පිටපත් ලබා නොගැනිම හේතුවෙන් පැවරුම් කටයුතු සිදු කර ගෙන නොතිබුණි.	සුසාන භූමි දෙකෙහි පිඹුරු පිටපත් ලබා ගැනීම සඳහා 2024 ජනවාරි 08 හා 2024 ජුලි 29 හා 2024 නොවැම්බර් 26 දිනැති ලිපි මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ලිපි යවා ඇති බව.	පිඹුරු පිටපත් ලබාගෙන පැවරුම් කටයුතු සිදු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ රියදුරු තනතුරට ඇතුළත් නොවූ වැඩ ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු හා යන්ත්‍ර කම්කරු තනතුරුවල රාජකාරීන්වල නියුතු නිලධාරීන් 09 දෙනෙකු සඳහා වාහන රියදුරු රාජකාරී පවරා තිබුණි.	දැනට ස්ථිර පත්වීම් සඳහා බඳවා ගැනීම් නතර කර ඇති බවත්, බඳවා ගැනීම් සිදු කළත් බඳවා ගැනීමට හැකියාව ඇත්තේ එක් රියදුරෙකු පමණක් බව.	අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවාගෙන පුරප්පාඩු සේවකයින් සඳහා බඳවා ගැනීම් කළ යුතුය.
(ආ)	මියගිය, සේවය හැරගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ සේවකයින් 15 දෙනෙකුගෙන් ආපදා ණය, උත්සව අත්තිකාරම්, විශේෂ අත්තිකාරම් හා ගංවතුර ණය මුදල් වෙනුවෙන් අය විය යුතුව තිබූ එකතුව රු. 1,131,159 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අපේක්ෂිත අරමුණු 23 ක් යටතේ ක්‍රියාකාරකම් / ව්‍යාපෘතීන් රාශියක් දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් හා මිලදී ගැනීම් ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීමට අපේක්ෂිත වූ ක්‍රියාකාරකම් 13 ක් අතරින් එක් ක්‍රියාකාරකමක් පමණක් ඉටු කර තිබුණි.	පිළිගන්නා බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුය.
(ආ)	පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් ක්‍රියාකාරකම් වෙනුවෙන් කාර්යසාධන දර්ශක හඳුනාගෙන තිබුණද එම දර්ශක අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය මිනුම් කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් ක්‍රියාකාරකම් වෙනුවෙන් කාර්යසාධන දර්ශක හඳුනාගෙන එම දර්ශක අනුව ප්‍රගතිය මිනුම් කර ඇති බව.	හඳුනාගත් දර්ශක අනුව ඊට අනුකූලව නිවැරදිව ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් මිණුම් කළ යුතුය.
(ඇ)	යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ඉටු කිරීමට අපේක්ෂා කර තිබුණු ක්‍රියාකාරකම් 05 ම ඉටු කර නොතිබුණි. මාර්ගගත කාණු නඩත්තුව යටතේ ක්‍රියාකාරකම් 05 ක් දක්වා තිබුණද, ක්‍රියාකාරකම් 02 ක් ඉටු කර නොතිබුණු අතර , ක්‍රියාකාරකම් 03 ක් ඉටු කරමින් පැවතුණි.	ලේඛනය යාවත්කාලීන කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව.	ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් අදාල කාල පරිච්ඡේදය තුල ඉටු කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුළ කරුණු 11 ක් යටතේ විගණනය කළ යුතු අංශයන් දක්වා තිබුණද 2024 දෙසැම්බර් මාසය වන විට විගණන විමසුම් 03 ක් පමණක් නිකුත් කර තිබුණි. ඒ අනුව අභ්‍යන්තර විගණන සැලැස්ම මගින් අපේක්ෂිත විගණන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කටයුතු කළ යුතුය.

4.3 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ 2024 වර්ෂය සඳහා සඳහා ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම රු. 258,960,987 ක් වූ අතර වර්ෂය අවසානයට තත්‍ය වියදම රු.183,579,288 ක් හෙවත් සියයට 71 ක් වූ අතර විචලනය සියයට 29 ක් විය.	පිළිගන්නා බව.	අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය.
(ආ)	සභාවේ පුනරාවර්තන වැය විෂයන් 87 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු.26,877,280 ක් වූ අතර එම ඇස්තමේන්තුගත මුදලින් කිසිදු මුදලක් ප්‍රවර්තන වර්ෂයේදී වැය කර නොතිබුණි.	-එම-.	-එම-.
(ඇ)	ඇස්තමේන්තුගත වියදම රු.29,298,160 ක් වූ වැය විෂයයන් 36 ක ඉතිරිය සියයට 51 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.	පිළිගන්නා බව.	-එම-
(ඈ)	ස්වයං උත්පාදන ආදායම්වලින් කරනු ලබන ප්‍රාග්ධන වියදම් සඳහා සභාවේ වැය විෂයයන් 08 ක් සඳහා ඇස්තමේන්තු කරන ලද අයවැයගත ප්‍රතිපාදන වටිනාකම වූ රු.3,187,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වැය කර නොතිබුණි.	-එම-.	-එම-.
(ඉ)	සභාවේ අයවැයගත ආදායම් ශීර්ෂ 08කට අදාල ඇස්තමේන්තුගත ආදායම රු.121,340,000 ක් වූ අතර ඉන් රැස්කළ ආදායම රු.1,771,000 ක් විය. අයවැය ගත ආදායමින් රැස්කර ගැනීමට නොහැකි වූ ආදායම් ප්‍රතිශතය සියයට 76 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.	-එම-.	-එම-.
(ඊ)	ආදායම් ශීර්ෂ 36 ක අයවැයගත ආදායමේ එකතුව රු.94,722,570 ක් වූ අතර රැස්කළ	ඇස්තමේන්තුව ඉක්මවා ලද ආදායම් ශීර්ෂ සඳහා	-එම-

ආදායමේ එකතුව රු.128,593,792 ක් විය. අයවැය ගත ආදායම ඉක්මවා ආදායම රැස්කිරීමේ විචලනය සියයට 103 සිට සියයට 133000 දක්වා පරාසයක විය.	2024 වර්ෂයේදී පරිපූරක අයවැයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව.	

4.4 පාරිසරික ගැටලු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ කසල කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.34,126,914ක වියදමක් දරා තිබුණු අතර කසල අලෙවිය තුළින් රු.26,850,049 ක ආදායමක් ලබාගෙන තිබුණි. එහෙත් කසල කළමනාකරණය සඳහා යෙදවිය යුතු සේවක සංඛ්‍යාව ඒ සඳහා යෙදවිය යුතු යන්ත්‍ර සූත්‍ර සඳහන් කර තිබුණද 2024 වර්ෂය සඳහා කසල කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා වන වැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණු අතර එහි අධීක්ෂණය හා වගකීම් පවරා ඇති නිලධාරින් කවුරුන්ද යන්න දක්වා නොතිබුණි.	2025 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලද බව.	කසල කළමනාකරණය විධිමත් සැලසුමකට අනුව කළ යුතුය.
(ආ)	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ ක්‍රමවේදයක් සභාව හඳුන්වා දී නොතිබුණු අතර සතිපොළ අසල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ගොඩ ගසා තිබුණි.	ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය සභාව විසින් එකතු නොකරන අතර මේ සඳහා ජාතික විසඳුමක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව.	අනවසර අන්දමින් කසළ බැහැර කිරීම වැළැක්වීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයේ සිට 2027 වර්ෂය සඳහා කසල කළමනාකරණය වෙනුවෙන් පස් අවුරුදු ක්‍රියාකාරී සැලසුමක් සකස් කර තිබුණද 2023 හා 2024 වර්ෂවලට අදාළව ක්‍රියාකාරකම් ඉටුකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව සඳහන් කර නොතිබුණි.	2025 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම සකසන ලද බව.	ක්‍රියාකාරී සැලසුම වාර්ෂිකව සකස් කළ යුතුය.

4.5 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු 10 ක් ක්‍රියාත්මක කිරීම සඳහා දිගුකාලීන සැලැස්මක් සකසා තිබුණද එම අරමුණු ළඟා කර ගැනීමට අවශ්‍ය කාර්යයන් සැලසුම් කර නොතිබුණු අතර එහි ප්‍රගතිය මිණුම් කිරීමට ක්‍රමවේදයක් සකසා නොතිබුණි.	තිරසර අරමුණු ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් වේ. අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අදාල වැඩ සටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති බව.	තිරසාර සංවර්ධන සැලැස්ම වෙනම පිළියෙල කර එහි ප්‍රගතිය දැක්විය යුතුය.